2012/01/05

විදුහල්පතිතුමා/ තුමිය,

ප්‍රිය මහත්මයාණෙනි/ මහත්මියනි,

<u>දකුණු පළාත් පාසල් කේවල චෙස් තරඟාවලිය</u>

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඇතිව සවුත්ලන්ඩ්ස් විද්‍යාලයීය චෙස් සංගමය මගින් මෙහෙයවන දකුණු පළාත් පාසල් කේවල චෙස් තරඟාවලිය 2012 ජනවාරි 27, 28, 29 යන තෙදින තුළ සවුත්ලන්ඩ්ස් විද්‍යාලයීය පරිශ්‍රයේදී පැවැත්වීමට කටයුතු යොදා ඇත.

* **ස්ථානය** : සවුත්ලන්ඩ්ස් විද්‍යාලය - ගාල්ල.
* **වයස් සීමා** : වයස අවු. 8, 10, 12, 14 සහ 16 න් පහළ බාලක/බාලිකා (2012 ජනවාරි 01 දිනට වයස ගණනය කරනු ලැබේ)
* **තරඟ කාලසටහන**

| | | |
|---|---|---|
| ජන.27 සිකුරාදා | පළමු වටය | ප.ව.3.00 - ප.ව.6.00 |
| ජන.28 සෙනසුරාදා | දෙවන වටය | පෙ.ව.7.30 - පෙ.ව.10.30 |
| | තෙවන වටය | පෙ.ව.11.00 - ප.ව.2.00 |
| | සිව්වන වටය | ප.ව.2.30 - ප.ව.5.30 |
| ජන.29 ඉරිදා | පස්වන වටය | පෙ.ව.7.30 - පෙ.ව.10.30 |
| | හයවන වටය | පෙ.ව.11.00 - ප.ව.2.00 |
| | | |
| **ත්‍යාග ප්‍රදානෝත්සවය ප.ව. 4.00 ට ආරම්භ වේ.** | | |

* **තරඟ නීතිරීති** :
    * සියලුම තරඟවල තීරණ FIDE හා CFSL නීතිරීති වලට යටත් වේ. ප්‍රධාන විනිසුරුගේ තීරණය අවසාන තීරණය වේ.
    * උපරිම තරඟ වට හයකි. (Swiss System)

* Tie Breakers
    1. Buchholz with Parameter
    2. The result of the players in the same point group
    3. FIDE
    4. Buchholz with Parameter

පදක්කම් සඳහා සම ලකුණු ලබාගත හොත් Play-off මගින් ජයග්‍රාහකයන් තීරණය කරනු ලැබේ.

* **තරඟ ගාස්තු -** එක් තරඟකරුවෙකු සඳහා රු. 300/= කි.

**පදක්කම් සහ කුසලාන -**

* ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන සඳහා පිළිවෙලින් රන්, රිදී හා ලෝකඩ පදක්කම් සහ සහතික පත් පිරිනැමේ. සිව්වන ස්ථානයේ සිට පහළොස්වන ස්ථානය දක්වා කුසලතා පදක්කම් සහ සහතික පත් පිරිනැමේ. (එම ඉසව්වේ තරඟ වදින ක්‍රීඩක/ක්‍රීඩිකාවන් සංඛ්‍යාව අනුව මෙය වෙනස් විය හැක.) සෑම ක්‍රීඩක ක්‍රීඩිකාවටම සහභාගිත්වය සඳහා වටිනා සහතික පතක් පිරිනැමේ.
* තරඟාවලියේ විශිෂ්ඨ දක්ෂතා දක්වන බාලක සහ බාලිකා පාසල් දෙක සඳහා සවුත්ලන්ඩ්ස් විද්‍යාලයීය අභියෝගතා චෙස් කුසලානය පිරිනමනු ලැබේ. (සියලුම වයස් කාණ්ඩවල පළමුවන ස්ථානයේ සිට දහවන ස්ථානය දක්වා ජයග්‍රහණය කරන ළමුන්ගේ ප්‍රසාද ලකුණු ඒ සඳහා උපයෝගි කරගනු ලැබේ.)
* **තරඟ ලියාපදිංචිය -** සියලුම තරඟකරුවන් 2012 ජනවාරි 25 දිනට ප්‍රථම තම පාසලේ චෙස් භාර ආචාර්යතුමා/තුමිය හෝ පුහුණුකරු මගින් ලියාපදිංචි වී තිබිය යුතුය. ලියාපදිංචි වීමේ ගැටලුව අවම කරගැනීම සඳහා අප සංගමයේ නිළධාරීන් 2012 ජනවාරි 25 දින ප.ව. 2.00 සිට ප.ව. 5.00 දක්වා පහත සඳහන් ස්ථානවලදී ලියාපදිංචිය සිදු කරනු ඇත.
    1. ගාල්ල සවුත්ලන්ඩ්ස් විද්‍යාලය
    2. මාතර ශාන්ත තෝමස් කුමර විද්‍යාලය
    3. අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලය
* තරඟකරුවන් තමා සතු චෙස් ඔරලෝසු රැගෙන පැමිණීම අපි අගය කොට සලකමු.
* ක්‍රීඩක ක්‍රීඩිකාවන් සියලුම දෙනා තම පාසලේ නිල ඇඳුමින් ක්‍රීඩා කිරීම අනිවාර්ය වේ.
* ක්‍රීඩක ක්‍රීඩිකාවන් සමග පැමිණෙන දෙමව්පියන් සඳහා අවශ්‍ය ඉඩ පහසුකම් සැලසීමට කටයුතු යොදා ඇත.
* විද්‍යාලයකින් සහභාගි වන දරුවන්ගේ සංඛ්‍යාව අනුව උපරිමය හතරකට යටත්ව දෙමව්පියන් සඳහා අප සංගමය මගින් අවසර පත් නිකුත් කරනු ලබන අතර එය සවුත්ලන්ඩ්ස් විද්‍යාලයීය පරිශ්‍රයට ඇතුල් වීම සඳහා භාවිතා කළ හැක. වෙනත් කිසිදු දෙමව්පියෙකුට විද්‍යාලයීය පරිශ්‍රයට අවසරයකින් තොරව ඇතුල්වීම සපුරා තහනම් වේ.
* සවුත්ලන්ඩ්ස් විද්‍යාලය හා දෙමාපියන්ට ඉඩ පහසුකම් සපයා ඇති ස්ථාන වල දේපල වලට හානි නොවන සේත් එම පරිශ්‍රයන් පිරිසිදුව තබා ගනිමින් විනයගරුකව හැසිරෙන ලෙසත් ගෞරවයෙන් ඉල්ලා සිටිමු.

* **තරඟාවලිය පිළිබඳ වැඩි විස්තර සඳහා**

සවුත්ලන්ඩ්ස් විද්‍යාලයීය,
චෙස් භාර ආචාර්ය - මාලා ජයසේකර මිය දු.ක. 071-4423564
චෙස් ක්‍රීඩා උපදේශක - අසේල හේමන්ත මයා දු.ක. 077-2336633

ස්තූතියි

.......................................... ..........................................

ගරු ලේකම් ගරු සභාපති